චක්‍රලේඛ අංක - 04 / 2012

මගේ අංකය : බ.ප/ස.සේ.කො.ස/ලේ.නි- 2012
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත
අංක 121 / 3 , කිරුළපන මාවත,
කොළඹ 05
2012. ජනවාරි. ..24.. දින

බස්නාහිර පළාතේ සියලුම විවිධ සේවා සමුපකාර සමිති,
ග්‍රාමීය බැංකු සංගම්,
ස.ණ.ස. සමිතිවල
සභාපතිවරුන් වෙත.

<u>2006.12.31 දිනට පත්වීම් ස්ථිර නොවීම හා ස්ථිර කිරීමේ ලිපි නොමැති වීම</u>

බස්නාගිර පළාතේ සමුපකාර සමිති විසින් බස්නාගිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සේවය ස්ථිර වී නොමැති සමුපකාර සේවකයින් කාණ්ඩ දෙකක් සිටින බවට අනාවරණය වී ඇත.

කාණ්ඩ 01 - ගුමන හෝ තනතුරක පත්වීම කොමිෂන් සභාවෙන් ස්ථිර වී නොමැති හා පත්වීම ස්ථිර කිරීමේ ලිපියක් නොමැති සේවකයින්

කාණ්ඩ 02 - කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය මත වර්තමානයේ දරණ තනතුරේ පත්වීම ස්ථිර කර ඇති නමුත් සමිතියට බඳවා ගන්නා ලද මුල් තනතුරට අදාළ පත්වීම ස්ථිර වී නොමැති හා එම පත්වීම ස්ථිර කිරීමේ ලිපියක් නොමැති සේවකයින්

2. සමුපකාර සමිතිවල එවකට පැවැති අධ්‍යක්ෂ මණ්ඩල විසින් සමුපකාර සේවක රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කර නොමැති වීම මෙම තත්වයට බලපා ඇති අතර, ඒ හේතුවෙන් සමුපකාර සේවකයින්ගේ විශ්‍රාම වැටුප් කාර්යයන් සඳහා අදාළ කර ගත හැකි ස්ථිර සේවා කාලයක් නොමැති වීම හෝ සැලකිය යුතු සේවා කාලයක් අහිමි වන බව ද පෙනී ගොස් ඇත.

3. (I) - එබැවින් මෙම චක්‍රලේඛයේ පළමු ඡේදයේ දක්වා ඇති කාණ්ඩ 01 ට හා 02ට ඇතුළත් වන බස්නාගිර පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය ක්‍රියාත්මක දිනට සේවයේ නියුතක්තව සිටි සේවකයින් මෙහි 04 වන ඡේදයේ දැක්වෙන කොන්දේසි වලට යටත්ව මුල් පත්වීමට අනුරූප වන තනතුරට බඳවා ගත් දින සිට ස්ථිර කිරීමට අවරණ අනුමැතිය බස්නාගිර පළාත් සමුපකාර සේවක කොමිෂන් තීරණය කර ඇත.

(II) - ඉහත පළමු ඡේදයේ කාණ්ඩ අංක 01ට ඇතුළත් වන සමුපකාර සේවකයින් ඉහත 3 හි I පරිදි මුල් පත්වීමේ දින සිට ස්ථිර කරනු ලැබුව ද 2006.12.31 දින වනවිට මුල් පත්වීමට අනුරූප තනතුර වෙනස් වී ඇත්නම් එම තනතුරට අදාළ විස්තර කොමිෂන් සභාව වෙත වාර්තා කර එකී තනතුරද අනුමත කරවා ගත යුතුය. 2006.12.31 වන දිනට පසුව සමිති විසින් විධිමත් ක්‍රමවේදය අනුගමනය නොකර තනතුරු වලට පත්කර ඇත්නම් හෝ උසස්කර ඇත්නම් එවැනි පත්වීම් සඳහා කොමිෂන් සභාව අනුමත කරනු නොලැබේ.

02 පිටුවට

4. කොන්දේසි

I. බස්නාහිර පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට හෝ ඉන් පසුව සේවයේ නියුක්තව සිටි හා සිටින සේවකයින් සඳහා පමණක් මෙම චක්‍රලේඛයේ විධිවිධානයන් අදාළ වේ.

II. මුල් තනතුරට අදාළ පත්වීම ස්ථිර කිරීම විශ්‍රාම වැටුප් කාර්යයන් සඳහා පමණක් අදාළ කර ගත යුතු අතර, අවසාන වරට අනුමත ස්ථිර තනතුරේ හෝ වැටුපෙහි වෙනසක් කරන ලෙස ඉල්ලා සිටීමට කිසිදු සේවකයෙකුට හිමිකමක් නොමැත.

III. මුල් පත්වීමේ දින සිට ස්ථිර කරනු ලබන තනතුරට අදාළ පත්වීම එවකට වලංගුව පැවැති පිරිස්බල තක්සේරුවේ සියලුම ප්‍රතිපාදනයන්ට (තනතුරු නාමය/වැටුප් පරිමාණ අංකය/ සේවක සංඛ්‍යාව) යටත් විය යුතු අතර. එසේ වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය / කාරක සභාව සහතික විය යුතු වේ.

IV. බඳවා ගන්නා අවස්ථාවේ වයස අවුරුදු 45 ඉක්මවා නොසිටිය යුතු අතර අදාළ දිස්ත්‍රික්කය තුළ වසර 02 ක පදිංචිය තිබිය යුතු වේ.

**පත්වීම් ස්ථිර කිරීම සඳහා ආවරණ අනුමැතිය ලබාදීමේ ක්‍රමවේදය හා උපදෙස්**

I. ඉහත 4 ඡේදයේ කොන්දේසි අනුව සුදුසුකම් සපුරාලන සියලුම සේවකයින්ගේ මුල් පත්වීමේ දිනය, තනතුරු නාමය, හා වැටුප් පරිමාණය ආදී විස්තර පමණක් ඇතුළත් කර ලේඛනයක් සමිති විසින් සකස් කළ යුතු අතර එම ලේඛනය සකස් කළ හා පරීක්ෂා කළ අයගේ අත්සන් සහිතව සභාපති විසින් සහතික කිරීමෙන් අනතුරුව අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ද සමඟ කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට ඉදිරිපත් කළ යුතු වේ. මෙම චක්‍රලේඛයේ 3 ඡේදයේ II පරිදි තනතුර වෙනස් වී ඇත්නම් එම විස්තර ද ඇතුලත් ව ලේඛනය සකස් කළ යුතු වේ.

II. මෙම චක්‍රලේඛයේ විධි විධාන අනුව කොමිෂන් සභාව විසින් එම ලේඛනයේ තොරතුරු සලකා බලා ස්ථිර කිරීමට ආවරණ අනුමැතිය ලබා දීමට කටයුතු කරනු ලබන අතර, එම ආවරණ අනුමැතිය ලබා දෙනු ලබන ලිපියේ අංකය හා දිනය ආදී විස්තර සඳහන් කර මින් එක් එක් සේවකයාට පත්වීම ස්ථිර කිරීමේ ලිපියක් ලබා දිය යුතු අතර. එහි පිටපතක් අදාළ සේවකයින්ගේ පුද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කළ යුතු වේ.

කොමිෂන් සභාවේ නියමය පරිදිය,

අයි. ආර්. සෝමසිරි,
ලේකම්
මුපකාර සේවක කොමිෂන් සභාව
නාහිර පළාත

පිටපත් :-

1. බස්නාහිර පළාත් ප්‍රවාහන හා සමුපකාර අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්
2. බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්,
3. ලේකම්, බස්නාහිර පළාත් ප්‍රවාහන හා සමුපකාර අමාත්‍යාංශය
4. බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ / කළුතර / ගම්පහ)
6. ලේකම් , සමුපකාර සේවක කොමිෂන් සභාව
7. සියලුම පළාත් සමුපකාර කොමිෂන් සභා ලේකම්වරුන්
8. සියලුම වෘත්තීය සමිති සංගම්